05



# ඔරු පැදීම



කමලේන්ද්‍රන් ඔහුගේ අම්මාත්, තාත්තාත් සමග වැලිපැන්න ගමේ ජීවත් වෙයි. ඔවුන් එහි පදිංචියට ආවේ ළඟ දී ය. අම්මාත්, තාත්තාත් සිංහල හොඳින් දනිති. එහෙත් කමලේන්ද්‍රන්ට හොඳින් සිංහල කතා කළ නො හැකි ය. අම්මා ඔහුට සිංහල කතාබහ හුරු කරවන්නට වෑයම් කරයි.

කමලේන්ද්‍රන් ගමේ ළමයින් ඇසුරු කරයි. මාලිංග, කෝසල, මාහිර් ඔහුගේ හොඳ ම යාළුවෝ ය. වැලිපැන්නට මේ දවස්වල හරි වැස්ස. ඇළේ හා වෙල්යායේ වතුර පිරී ඇත. කමලේන්ද්‍රන් යාළුවන් සමග ඔරු පදින්නට ගියේ ය. ඔහු ආපසු එන්නේ ඇඳුම් හොඳට ම තෙමා ගෙන ය. අම්මා ඔහුගෙන් සිදු වූ දේ අසයි. කමලේන්ද්‍රන් සිංහලෙන්, එහෙත් කෙටියෙන් පිළිතුරු දෙයි.

"පුතේ..... පුතේ, මොක ද මේ ඇඳුම් තෙමා ගෙන? ඔයා වැස්සට තෙමුණා ද?

"වැස්සේ නෑ"

"යාළුවෝ හම්බ වුණේ නැද්ද?"

"යාළුවෝ ගියා"

"එහෙනම් පුතා නෑවා ද?"

"නෑ, අපි ගියා ඇළ ගාවට."

"ඉතින් මොකද වුණේ?"

**"මාව ලිස්සලා වැටුණා."**

"ඇළේ වතුර පිරිලා ද පුතා?"

**"වතුර පිරිලා."**

"වෙලෙත් වතුර පිරිලා ද?"

**"ඔව්, වෙල පේන්නේ නෑ."**

"පුතාලා සෙල්ලම් කළා ද?"

**"ඔව් සෙල්ලම් කළා."**

"වතුරේ පීනුවේ නෑ නේ ද?"

**"නෑ, ඔරු පැද්දා"**

"මොනවා! ඔරු පැද්දා කොහෙන් ද ඔරුවක්?"

**"ඇයි නිමල් මාමාගේ ඔරුව."**

"පුතාලා තොටුපොළටත් ගියා ද?"

**"ඔව් අපි ඔරුව තල්ලු කරගෙන ආවා"**

"ඔරුව පැද්දේ මොකෙන් ද?"

**"හබලෙන්, එකයි තිබුණේ."**

"එතකොට කොහොම ද ඔරුවක් පදින්නෙ?"

"මාහිර් ගෙදර ගියා"

"ඒ මොකට ද එයා ගෙදර ගියේ?"

"පිහියක් ගේන්න."

"ඊට පස්සේ මොකද වුණේ පුතා?"

"කෝසල ලෑල්ලක් ගෙනාවා"

"පුතාලා ලෑල්ලෙන් හබලක් හැදුවා නේ ද?"

"ඔව්. ටිකක් ඈ...... තට ගියා. කෝසල වැටුණා."

"මොනවා! ඒ දරුවා වතුරට වැටුණා ද? කෝ ඒ ළමයා?"



"කෝසල යට ගියා"

"මොනවා?"

"නෑ, නෑ .......... අම්මා මාමලා ආවා. කෝසල ගත්තා."

"කෝ දැන් කෝසල? එයාට අමාරු ද?"

"එයා, ගෙදර ගියා"

"ගං වතුරේ ඔරු පදින්න හොඳ නෑ"

"ඔව් අම්මා. මීට පස්සේ යන්නේ නෑ."



## ක්‍රියාකාරකම 01

පන්තියේ ශිෂ්‍යයන් දෙදෙනෙකු එක් වී කමලේන්ද්‍රන් හා අම්මා අතර ඇති වූ සංවාදය නිසි හඬ පාලනයෙන් යුතු ව ඉදිරිපත් කරන්න.
வகுப்பறையில் மாணவர்கள் இருவர் இணைந்து கமலேந்திரனுக்கும் தாயுக்கும் இடையில் இடம் பெற்ற உரையாடலை உரிய மொழி நடையில் முன்வைக்கவும்.

## ක්‍රියාකාරකම 02

කමලේන්ද්‍රන් මුහුණ දුන් අත්දැකීමෙහි ඇතුළත් සිදුවීම් අනුපිළිවෙළින් ලියන්න.
கமலேந்திரன் முகங் கொடுத்த அனுபவங்களில் அடங்கியுள்ள சம்பவங்களை ஒழுங்கு முறையில் எழுதுக.

## ක්‍රියාකාරකම 03

ඔබ කමලේන්ද්‍රන් යයි සිතා ඒ සිදුවීම් ඔබේ වචනයෙන් විස්තර කර ලියන්න.
உங்களை கமலேந்திரன் என நினைத்து இச் சம்பவத்தை உங்கள் வசன நடையில் விளக்கி எழுதுக.

## ක්‍රියාකාරකම් 04

ඔබ ලියූ විස්තර නිසි හඬ පාලනයෙන් යුතු ව පන්තියට ඉදිරිපත් කරන්න.
நீங்கள் எழுதிய விளக்கத்தை உரிய மொழி உச்சரிப்புடன் வகுப்பறையில் முன்வைக்கவும்.

## ක්‍රියාකාරකම් 05

පහත දී ඇති වගන්ති අනුපිළිවෙළින් ගළපන්න. එය පන්තියට ඉදිරිපත් කරන්න.
பின்வரும் பந்தியை ஒழுங்கு வரிசைப்படுத்தி அதனை வகுப்பறையில் முன்வைக்கவும்.

- පාසලේ යාළුවෝ පිරිලා හිටියා.
- තැපැල් මාමා ලියුම් ගෙනාවා.
- හැමෝ ම බලා ගෙන හිටියේ ආසාවෙන්,
- අක්කාගේ යාළුවන්ගෙ ඇස්වල සතුටු කඳුළු පිරිලා,
- බොහෝ දෙනෙක් විභාගෙන් පාස් වෙලා.
- මං හිතුවාට වඩා මගේ අක්කාගේ ප්‍රතිඵල හොඳයි.
- විදුහල්පතිතුමිය අද ඉන්නෙ හරි සතුටින්.
- අප දැනගත්තේ ඊයේ.
- අක්කායි මමයි උදෙන් ම පාසලට ගියා.
- පන්ති භාර ගුරුතුමිය හැමෝට ම සුබ පැතුවා.
- තාත්තා අක්කාට දෙනවා කිව්ව තෑග්ග දුන්නා.
- විභාග ප්‍රතිඵල නිකුත් වෙලා.
- මටත් හරි සතුටුයි.